**ශීර්ෂය - 284 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

----------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් නොවන ලැබීම්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 දරන | | |
| **a)** 3.2 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා, අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ආදායම්, වියදම් සහ ප්‍රධාන ලේජර් ශේෂයන් සමඟ එකඟ වන බවට සහතික විය යුතුය. ඊට පැටහැනිව භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ලැබීම් රු.54,462,979 ක් වුවද අත්තිකාරම් ලැබීම් ලෙස අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට බැර කරන ලද රු.2,083,734 ක වටිනාකම නොසලකා රු.52,379,245 ක් පමණක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගලපා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කරනුයේ CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුමෙහි ඇතුළත් දත්තයන් වන අතර, එයට අනුව අත්තිකාරම් ලැබීම් වන රු.52,379,245 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර ඇති බව දන්වමි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **b)** 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් ඒකතු කරන ලද ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් නොකළ යුතු අතර එම ආදායම අග්‍රිමඩ සැසඳුම් ප්‍රකාශය තුළ ගැලපීම් කළ යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ඒකතු කරන ලද රු.77,714,535 ක් වූ ආදායම්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට වෙනත් ආදායම් ලෙස රු.77,714,535 ක මුදලක් ඇතුළත් කර නොමැති බව දන්වමි. | -එම- |
| (ii) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි 2020 වර්ෂය සඳහා වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස රු.958,895,389 ක් සටහන් කර තිබුණද එවැනි ලැබීමක් විගණනයට නිරීක්ෂණය නොවීය. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි 2020 වර්ෂය සඳහා වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස දක්වා ඇති අගය මුද්‍රණ දෝෂයක් වන අතර එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා ඇත. | 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක අගයන් නිවැරදිව දැක්විය යුතුය. |

**(ආ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනාගත සේවා ඉටුකිරීමේ දායකත්වය බලාපොරොත්තුවෙන් සම්පත් සඳහා කරනු ලබන මුදල් ගලායාම් ප්‍රමාණය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ඇති වන මුදල් | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් අනාගත | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය නිවැරදිව හඳුනාගත |

| | | |
|---|---|---|
| ප්‍රවාහයන් මඟින් නියෝජනය කරන නිසා එම මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කළ යුතුය. එසේ වුවද මූල්‍ය ප්‍රකාශ අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් යටතේ දරන ලද රු.179,508,496 ක මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද එම වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබුණි. | සේවා ඉටු කිරීමේ දායකත්වය ලබා ගැනීමේ අවශ්‍යතාවය වන බැවින් ඒම වියදම් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇත. | යුතුය. |

**(ඇ) තැන්පතු**

---------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි සඳහන් ආකෘතිය ප්‍රකාරව තැන්පතු ලැබීම් හා ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් වශයෙන් දැක්විය යුතුය. එසේ වුවද පොදු තැන්පත් ගිණුමක් වශයෙන් දක්වා තිබෙන වනසත්ව සංරක්ෂණ අරමුදලට ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.367,453,577 ක් හා රු.1,356,488,482 ක් මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | වනසත්ත්ව සංරක්ෂණ අරමුදල වනසත්ව හා වෘක්ෂලතා ආඥා පනත අනුව පවත්වාගෙන යනු ලබන විශේෂිත ගිණුමක් බැවින් ඒ යටතේ වන ගනුදෙනු මූල්‍ය ක්‍රියාකාරකමක් ලෙස දක්වා ඇති බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**(ඈ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.2 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති සංඛ්‍යාව, අවසාන | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය දෙපාර්තමේන්තු දත්ත පදනම් කරගෙන සකසා ඇති අතර, භාණ්ඩාගාර ගිණුම් අනුව වන අගයන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය මගින් ගැලපීම් සිදුකොට ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ආදායම්, වියදම් සහ ප්‍රධාන ලේජර් ශේෂයන් සමඟ එකඟ වන බවට සහතික විය යුතු වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ඇතුලත් කිරීමේදී භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.39,534,166 ක් හා රු.55,690,601 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව පිළිවෙලින් රු.36,205,110 ක් හා රු.55,104,615 ක් වූයෙන් පිළිවෙලින් රු.3,329,056 ක හා 585,986 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ඉ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශය**
------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 7.5 ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනැති දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතුය. 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ඒ අනුව දැක්විය යුතු වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ඇතුළත්කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා සංසන්දනාත්මක දත්ත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

(ඊ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය හා ක්ෂේත්‍ර කාර්යාලවල පවතින විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් එක් එක් කාර්යාලවලද පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 11 ක සියයට 30 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | Covid 19 වසංගතය, අයහපත් කාලගුණික තත්ත්වය හා අමුද්‍රව්‍ය මිල ඉහළයාම, අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක 21/1596/304/134 හා 2021 අගෝස්තු 31 දිනැති ලිපිය අනුව ප්‍රතිපාදන අවුරා තැබීම මේ සඳහා හේතු වූ බව දන්වමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලැස්මකින් හා කළමණාකාරීත්වකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| **i.** XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද | 1,127,483 | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කල නිලධාරීන් 26 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 05 ඉක්ම වූ රු.1,127,483 ක ණය ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරමින් පවතින අතර, අනෙකුත් නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකයට අනුව මැතිවරණ දෙපාර්තමේන්තු වෙන් ලබාගත් තොරතුරු මත ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| **ii.** XLVIII පරිච්ඡේදයේ 1.2 ඡේදය | | නිලධරයන් අතින් සිදුවන්නා වූ සියලුම විෂමාචාර ක්‍රියාවන් හෝ ප්‍රමාද දෝෂයන් සම්බන්ධව හැකිතාක් ඉක්මනින් විනය බලධරයන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අදාළ අනෙකුත් ආයතන | විමර්ෂණ කටයුතු අවසන් කර නොමැති අතර ඒවායේ වර්තමාන තත්ත්වය විගණනයට ඉදිරිපත් කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රධානීන් විසින් ක්‍රියාකල යුතුය. එසේ වුවද විනය ක්‍රියාමාර්ග 14 ක් සම්බන්ධයෙන් විමර්ශනය සඳහා කමිටු පත්කර වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශන අවසන් කර නොතිබුණි. | | |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571** | 5,486,600 | තැන්පත් කල දින සිට වර්ෂ පහක් ඉක්ම වූ රු.5,486,600 ක් වූ පොදු තැන්පතු ගිණුම් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශව දැනුවත් කර ඇති අතර, ඒ සඳහා ඉදිරි මාස 02 ඇතුළත පිළිතුරු නොලදහොත් එම තැන්පත් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | | |
| | **i.** 2.14.1 (අතිරේක 35) | 557,320 | වටිනාකම රු.මිලියන 500 ට වැඩි භාණ්ඩ හා සේවා මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කළ යුතු වුවද 2021 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකම රු.631,067,014ක් වූ අලිවැට උපකරණ අයිතම 30 ක් මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත් 07 කට වෙන්කර අවස්ථා 07 ක දී ලංසු කැඳවීම් 07 ක් | 2021 වර්ෂය තුළදී 1500 km ක විදුලි වැට ඉදිකර අවසන් කිරීමේ අරමුණින් ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කර ගැනීම මෙන්ම තරගකාරිත්වය තුළින් අවම මිලක් යටතේ අවශ්‍ය භාණ්ඩ ලබාගත හැකිවීම පදනම් කරගෙන මෙලෙස Lot 07 කට වෙන් කර ලංසු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබුණි. මේ හේතුව නිසා මිල ගණන් කැඳවීමට පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමට හා තාක්ෂණික ඇගයීම් කමිටුවට අවස්ථා 07 කදී ගෙවීම සිදු කිරීම හේතුවෙන් රු.557,320 ක අතිරේක වියදමක් දරා තිබුණි. | කැඳවීම සිදුකර ඇති බව දන්වමි. | |
| **ii.** 3.9.1 | ප්‍රජා පාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ සමිති මඟින් කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීමේදී ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සිදු කිරීමට යෝජිත සමිතියේ යෝග්‍යතාවය ඇගයිය යුතු වුවද, කොන්ත්‍රාත් කාර්යයන් 05 ක් සඳහා කොන්ත්‍රාත් කටයුතු ප්‍රදානය කිරීමේදී තෝරා ගැනීමේ කමිටුව විසින් එලෙස කටයුතු කර නොතිබුණි. | අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් මගින් මෙය සිදු කරන අතර ඒ සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වයේ නියෝජිතයෙකුද සහභාගි වේ. එම කමිටුව විසින් සුදුසු ප්‍රජාපාදක සංවිධානයක් තෝරා ගැනීමේදී අදාළ කරුණු සලකා බලා තෝරාගැනීම සිදුකරනු ලැබේ. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 21 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්කගත කාර්යයන් 11 ක් සඳහා රු.17,500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් එම කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘති 05 ක වැඩ අවසන් කර ඇත. එක් ව්‍යාපෘතියක් කළමනාකරණ නිර්දේශ මත අවලංගු කරන ලදී. අනෙකුත් ව්‍යාපෘති 05 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මෙන් ඉටු කිරීමට නියමිතය. | ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂයේ වනජීවී කලාප 09 ක විදුලි වැට ඉදිකිරීම සඳහා මාර්ග එළිපෙහෙලි කිරීම හා විදුලි වැට ඉදිකිරීම සඳහා රු.29,322,490 ක් ඇස්තමේන්තුගත කර තිබුණද එහි ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | ඉඩම් ගැටළු, සමහර විදුලි වැටවල් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවට මායිම්ව පිහිටා තිබීම හේතුවෙන් හා එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබීමත්, ගොවි සංවිධාන මාර්ගයෙන් මෙය ඉටුකිරීමේදී ඇස්තමේන්තු මුදලට සිදු කිරිමට නොහැකි වීම වැනි හේතු නිසා මෙම කටයුතුවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට වඩා අඩු වූ බව දන්වමි. | ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදේශාධාර ව්‍යාපෘතිවලින් ලැබෙන වත්කම් වාර්තා ගත නොවීමේ අවදානම 2020 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මගින් පෙන්වා දී තිබුණද 2022 පෙබරවාරි 19 දින විගණනය විසින් GIZ ව්‍යාපෘතියෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් උපකරණ හා වත්කම් සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂා කිරීම අනුව රු.20,755,328 ක් වටිනා වත්කම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගබඩාවෙහි GIZ වට්ටෝරු පොත්වල වාර්තා කර නොතිබුණි. අදාළ උපකරණ ආයතනය විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට විධිමත්ව භාරදී තිබුණද එම දත්ත ගිණුම් අංශය හා ප්‍රධාන ගබඩාව වෙත වාර්තා නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල, දක්වා නොතිබුණි. | GIZ ව්‍යාපෘතිය මගින් ලැබෙන භාණ්ඩ විධිමත්ව ප්‍රධාන ගබඩාව හරහා නිකුත් කිරීමට කටයුතු කරන ලෙසට ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | විධිමත් පරිදි බඩු ලේඛන පොත්වල වාර්තා කළ යුතුය. |

### 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පිළියෙල කර ඇති හානි පාඩු ලේඛනයෙහි සඳහන් රු.14,355,383 ක අලාභ හානි මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි. | මේ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බලා 2022 විසර්ජන ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් | පරීක්ෂණ මණ්ඩල විසින් මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ සිදුකරමින් පවතින අතර අවසාන වාර්තා ලබා දෙන ලෙස සිහිකැඳවීම් යවා ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවීමට කටයුතු කල යුතු වුවද වාහන අනතුරු 10 ක් සම්බන්ධව අනතුර සිදු වී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද වාහන අනතුරු 17 ක් සම්බන්ධව අනතුර සිදු වී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | රට යථා තත්ත්වයට පත්වූ වහාම මෙම පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට ඔවුන්ට උපදෙස් ලබාදී ඇත. | -එම- |

**3.5 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>--------- |
|---|---|---|---|
| (අ) | මුතුරාජවෙල පරිසර පද්ධතියේ හෙක්ටයාර 1285 ක බිම් කොටසක් 1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභයභූමියක් ලෙස ගැසට් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභයභූමියේ මායිම් ලකුණු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | මේ වන විට අදාළ උසාවි නියෝගයන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බැවින්, මෙම වසර තුළ අදාළ කටයුතු අවසන් කිරීමට හැකි වනු ඇති බව දන්වමි. | අභයභූමියේ මායිම් නිශ්චිතව ලකුණු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 සහ 2021 වර්ෂ තුළදී විදුලි වැට ඉදිකිරීම හා නඩත්තුව සඳහා දරන ලද වියදම පිළිවෙලින් රු.257,521,334 සහ රු.714,695,969 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ විදුලි වැටෙහි දිග ප්‍රමාණය කිලෝමීටර් 4,756 ක් විය. එසේ වුවද පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවමවීමක් නිරීක්ෂණය නොවීය. | මෙයට හේතුව වන්නේ වනඅලි මිනිස් ගැටුම් පවතින ප්‍රදේශවල ආර්ථික ක්‍රියාකාරිත්වය සීඝ්‍රයෙන් වර්ධනය වීමත් සමග එය හේතුකොට ගෙන වන අලීන්ගේ සංචරණ මං පෙත්වලට බාධා ඇති වීම හා රක්ෂිතවලින් බැහැරව වන ගැටුම් මැඩලීම සඳහා යොදා ගන්නා උපක්‍රමයන් නිසි ප්‍රමිතියෙන් යුතුව ක්‍රියාත්මක වීමට බාධා ඇති වීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත. | අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා විධිමත් උපක්‍රමයන් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | උඩවලව ප්‍රදේශයේ මීටර් 500 කට වනඅලි සංචරණ බාධක තැටි 6,000 ක් එලීම සඳහා 2021මාර්තු 15 දින රෙඩෙකෝ ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව දින 90 ක් ඇතුලත එනම් 2021 ජුනි 15 වන විට කාර්ය නිම කළ යුතු වුවද 2022 මාර්තු වන විටත් ගිවිසුම්ගත වටිනාකම රු.18,446,000 ක් වූ වනඅලි සංචරණ බාධක තැටි 4,010 ක් සපයා නොතිබුණි. | 2021 වර්ෂය පුරාම පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මෙන්ම භාණ්ඩ මිල සීඝ්‍රයෙන් ඉහළ යාම හා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අපහසුව හේතුවෙන් සංචරණ බාධක තැටි නිෂ්පාදනය ප්‍රමාද වී ඇති නමුත් මේ වන විට REDECO ආයතනය එම සංචරණ බාධක තැටි නිපදවා ඇති අතර, ඒවා උඩවලව ප්‍රදේශයට ප්‍රවාහනය කිරීමට කටයුතු යොදා ඇත. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයේ කිලෝ මීටර් 1,500 දිග විදුලි වැට ඉදි කිරීම සඳහා අවශ්‍යවන පෙරසවි බල ශක්ති කුටි 194 ක්, පෙරසවි වැසිකිළි 385 ක් හා කොන්ක්‍රීට් කියුබ් 3,080 ක් මිලදී ගැනීම වෙනුවෙන් රෙඩෙකෝ ආයතනය සමඟ 2021 මාර්තු 15 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව දින 90 ක් ඇතුළත එනම් 2021 ජුනි 15 දින අවසන් වීමට පෙර සැපයීම් සිදු කළ යුතු වුවද 2022 | මේ වන විට සැළකිය යුතු ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇති අතර, විදුලි වැට ඉදි කරමින් පවතින ප්‍රදේශ සඳහා ඒවා ප්‍රවාහනය කිරීමට කටයුතු කර ඇත. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

මාර්තු වන විටත් ගිවිසුම් ගත වටිනාකම රු.46,683,426 ක් වූ පෙරසවි බල ශක්ති කුටි 59 ක්, කොන්ක්‍රීට් කියුබ් 634 ක් හා පෙරසවි වැසිකිලි 346 ක් සැපයීම් සිදු කර නොතිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 25 ක් ඇතුලුව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 924 ක් වූ අතර අතිරික්ත කාර්යමණ්ඩලය 45 ක් විය. | පුහුණුවන උපාධිධාරීන් 54 ක් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබීම හේතුවෙන් 202 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ අතිරික්තය 45 ක් ලෙස පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |